# සංකල්ප පත්‍රිකාව - e-nenapiyasa

## තාර්කිකය (Rational)

දියමන්ති ව්‍යාපෘතියෙහි අවසන් ඉලක්කය දරුවාගේ අධ්‍යාපන අයිතිය සුරැකීම සඳහා ස්වයං අධ්‍යයනය (Self Learning) දිරිමත් කිරීමයි. ඒ සඳහා දරුවා නිදහසේ අධ්‍යයනයෙහි යෙදෙන්නෙකු විය යුතුය. තම විවේකය, ඉගෙනීමෙහි නිරතවන ස්වයං ඉගෙනුම්කරුවෙකු ලෙස ඵලදායිව ඉගෙනීමට යොදා ගැනීමට දරුවා හුරුකරවීම පිණිස ශිෂ්‍යයා වෙත ලැබෙන ඉගෙනුම් ද්‍රව්‍ය බහුල කල යුතුය. ශ්‍රී ලංකාවේ ව්‍යාකූල පාසල් අධ්‍යාපන රටාව වෙනස් කල හැක්කේ එමඟිනි. දැනුම සොයා ප්‍රමිති රහිත ගුරුවරු හා පෞද්ගලික පන්ති කරා ගොස් දැනට ලබන විභාග කේන්ද්‍රීය අධ්‍යාපන කුසලතා මඟින් ඉහළට යන පාසල් ශිෂ්‍යයා නිපුණතා හා අත්දැකීම් රහිත පුරවැසියෙකු වීම වළක්වාලීම මෙම ව්‍යාපෘතියෙහි ඉලක්කය වේ.

# අරමුණු

I. ශ්‍රව්‍ය, දෘෂ්‍ය පාඩම් සකස් කිරීමට හැකි ගුරුවරු තෝරා පුහුණු කර ශ්‍රව්‍ය, දෘෂ්‍ය පාඩම් සැකසීම.

II. ශ්‍රව්‍ය, දෘෂ්‍ය ඉගෙනුම් මාධ්‍ය අන්තර්ජාලය මඟින් බෙදා හැරීමට මෘදුකාංගයක් නිර්මාණය.

III. සෑම විෂයකටම, සෑම පාඩමකටම, විවිධ පරාසයන් ආවරණය වන ලෙස පාඩම් සකස් කර *(අතිරේක දැනුම ද සහිතව)* රැස්කිරීම හා භාවිතයට හුරුකිරීම

IV. වර්තමාන දරු පරපුරට අවශ්‍ය වර්ණ, චලන, රූප, රිද්ම, රටා සහිත අධ්‍යයන අවස්ථා *( කළු/සුදු වෙනුවට)* ලබාදීම.

V. ගුරුවරු ඉගෙනුම් ද්‍රව්‍ය (Learning Content) නිර්මාණයට හුරු කිරීම මගින් වර්තමාන ලෝකයට උචිත ලෙස ගුරුවරයා සංවර්ධනය.

VI. දරුවාට ඉගෙනීම් සුහුරු හා ආකර්ශනීය මාධ්‍යයක් කිරීම හා වර්තමාන සුහුරු උපකරණ (Smart Assets) යහ භාවිතයට හුරු කිරීම *( අවභාවිතය නුහුරු කිරීම)*

VII. විභාග ඉලක්කගත පෞද්ගලික අධ්‍යාපනය වෙනුවට නිපුණතා ඉලක්කගත ස්වයං අධ්‍යාපන අවස්ථා බහුල කිරීම හා පාසල් දරුවන් ද පාඩම් නිර්මාණයට එක්කරගැනීම.

# ක්‍රමවේදය

I. තෝරාගත් ගුරුවරු පුහුණු කිරීම
II. එම ගුරුවරු මඟින් ශ්‍රව්‍ය/ දෘෂ්‍ය පාඩම් නිර්මාණය
III. පාඩම් බෙදා හැරීම සඳහා ඉගෙනුම් කලමනාකරණ පද්ධතියක් (LMS) නිර්මාණය (enenapiyasa - *ඊනැණපියස*)
IV. වීඩියෝ පාඩම් සැකසීම හා සහ සක්‍රිය පාඩම් (Interactive) සැකසීම.
V. සුවිශේෂ දුරස්ථ අධ්‍යාපන *( විෂය බාහිර හා විෂය සමගාමි)* අවස්ථා නිර්මාණය හා ක්‍රියාත්මක කිරීම.
VI. ඊට උචිත පරිදි ශ්‍රව්‍ය, දෘෂ්‍ය චිත්‍රාගාරයක් සැකසීම

# කාලරාමුව

I. ගුරුවරු තෝරා ගැනීම හා පුහුණු කිරීම *(2016 -2017)*
II. LMS සැකසීම ( *enenapiyasa* ) - *(2017 – 2018)*
III. ශ්‍රව්‍ය, දෘෂ්‍ය පාඩම් ඇතුළත් කිරීම හා ප්‍රවර්ධනය *(2019)*
IV. Video පාඩම් හා සහසක්‍රීය (Interactive) පාඩම් සැකසීම *(2020)*
V. ශ්‍රව්‍ය දෘෂ්‍ය චිත්‍රාගාරය සැකසීම *(2020)*
VI. සුවිශේෂ වැඩසටහන් නිර්මාණය හා ක්‍රියාත්මක කිරීම *( 2019 සිට ඉදිරියට)*
VII. නව තාක්ෂණික ක්‍රමවේද හඳුනාගැනීම, හඳුන්වාදීම හා ගුරුවරු තෝරා පුහුණු කිරීම

# ලබා ඇති ප්‍රගතිය

I. E- nenapiyasa සක්‍රිය කර ඇත. ලංකාවේ ව්‍යවහාරික හොඳම වෙබ් අඩවි අතර 300ට ඉහළ ස්ථාන වල පසු වේ.
II. ගුරුවරු 2000කට වැඩි සංඛ්‍යාවක් පාඩම් සැකසීම, නිර්මාණය හා ඉදිරිපත් කිරීම සඳහා දායක වේ.
III. ශ්‍රව්‍ය, දෘෂ්‍ය වීඩියෝ පාඩම් 2000 කට වැඩි සංඛ්‍යාවක් මුදා හැර ඇත.
IV. චිත්‍රාගාරය සකසා භාවිත කරයි (Audio, Video Unit)
V. Covid 19 ආපදාවේදී අධ්‍යාපන බිඳවැටීම් ආවරණය පිණිස "සති පාසල, Video පාඩම්, සහසක්‍රිය පාඩම්, අකුර, ඉලක්කම" සමඟ දරුවන්ට උපරිම දායකත්වයක් ලබාදුන් ලංකාවේ ප්‍රබලතම හා සක්‍රීය ඉගෙනුම් කළමනාකරණ පද්ධතියයි.
VI. නිතිපතා සිංහල, දෙමළ, ඉංග්‍රීසි මාධ්‍ය පාඩම් සකස් කිරීම හා අන්තර්ජාලයට එක් කිරීම සිදු කෙරේ.